# Holiday Assignments

**ADVANCE LEVEL**

**Subject: Communication and Media Studies   Grade 12   Medium: Sinhala**



ii. ආයතනික ප්‍රවණතා

ශ්‍රී ලංකාවේ මාධ්‍ය කර්මාන්තයේ වේගවත් ප්‍රමාණාත්මක වර්ධනයක් දක්නට ලැබේ. මාධ්‍ය ආයතන නිරන්තරයෙන් බිහි වීම හඳුනා ගත හැකි ප්‍රවණතාවකි.

- **හිමිකාරිත්වය**

මාධ්‍ය ආයතන බිහි වීම දිගින් දිගට ම වර්ධනය වීමෙන් රාජ්‍ය මාධ්‍ය කොටස (පංගුව) අවම වෙමින් පවතී.

- **ප්‍රාදේශීය මාධ්‍ය**

කොළඹ කේන්ද්‍රීය ව පවතින මාධ්‍ය ආයතන ක්‍රමික ව වෙනත් පළාත් කරා ගමන් කිරීම දක්නට ලැබේ. යාපනය නගරය කේන්ද්‍ර කර ගත් පුවත් පත්, ගුවන්විදුලි හා කේබල් රූපවාහිනී නාලිකා ආරම්භ වීම කැපී පෙනෙන තත්ත්වයකි.

- **මාධ්‍යකරුවෝ**

ජන මාධ්‍ය ආයතනවල මාණ්ඩලික මාධ්‍යකරුවන්ට වඩා නිදහස් සහ විශේෂාංග වාර්තාකරණයේ නියැලෙන මාධ්‍යකරුවන් බිහි වී නැත. ආයතනික බැඳීම්වලින් තොර ව තමන් විසින් නිර්මාණය කරනු ලබන මාධ්‍ය සන්දේශ විවිධ ආයතන සඳහා සපයනු ලැබේ. නව මාධ්‍ය ව්‍යවසායකත්වයක් මෙමගින් ඇති වී තිබේ.

- **ස්ත්‍රී පුරුෂ සමාජ තත්ත්වය**

ජනමාධ්‍ය ආයතනවල ස්ත්‍රී නියෝජනය සැලකිය යුතු ලෙස ඉහළ යමින් පවතී. එහෙත් තීරණ ගත හැකි මට්ටමේ ස්ත්‍රී නියෝජනය තව දුරටත් අවම මට්ටමක පවතී.

- **මාධ්‍ය නියාමනය**

රාජ්‍ය නියාමනය පවතින නමුත් ස්වයං නියාමන ක්‍රම පිළිබඳ උනන්දුවක් ඇති වී තිබේ. මාධ්‍ය ආයතන මඟින් තම ආයතනය වෙනුවෙන් ම වූ ආචාරධර්ම/ මාර්ගෝපදේශ සකසා ගැනීමට කටයුතු කර ඇත.

- **සංස්කාරක නිදහස**

ආයතනික වශයෙන් පවත්නා පාලනය හේතුවෙන් ජනමාධ්‍යවල සංස්කාරක නිදහස අවම වී තිබේ. දේශපාලනික වශයෙන් මෙයට ආර්ථික සම්බන්ධතා මත මාධ්‍ය සන්දේශ සකස් කිරීමට සිදු වීම රාජ්‍ය හා පෞද්ගලික යන ජනමාධ්‍ය දෙයාකාරයෙන් ම දක්නට ලැබෙන තත්ත්වයකි.

ජනමාධ්‍ය ක්‍රියාකාරිත්වයට හා වෘත්තීය සමිති ක්‍රියාකාරිත්වයට පහසුකම් සලකා ඇත්තේ රාජ්‍ය මාධ්‍ය පමණි.